## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/225/2023 (PSC)

ආර්.පී.එම්.වීරසිංහ,

**අභියාචකවරුන්**

**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය :-2026.02.18**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් ජනාධිපති නීතිඥ දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය සමග නීතිඥ මනීෂා දිසානායක මිය.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම්, පී.අරෝෂන මහතා.

### -<u>නියෝගය</u>-

### විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

ආර්.පී.එම්.වීරසිංහ යන අය විසින් 2023.12.18 වෙනි දින ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සම මගින් ඉල්ලා ඇත්තේ, ඔහු වෙත ඉදිරිපත් කර තිබූ චෝදනාවන්ගෙන් නිදොස් කර නිදහස් කරමින්, පනවා ඇති දඩුවම් ඉවත් කර දෙන ලෙසයි. ඉහත කී දඩුවම් පමුණුවා ඇත්තේ, අභියාචකට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින්, 2020.06.23 දිනැතිව නිකුත් කරන ලද චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා 09 කින්, 05 වන චෝදනාව හැර ඉතිරි චෝදනා 08ට අභියාචක වරදකරු බවට පත්කර තිබීම හේතුවෙනි.

එකී චෝදනා පහත සඳහන් පරිදි වේ.

*I.* ***ඔබ, මොනරාගල දිසාවේ වැල්ලවාය අඩවියේ වැල්ලවාය හා බුත්තල බීට්ටුවලට අයත් වන්දම දෙමලිය රජයේ කැලයේ කුඩාඔය හා දොමෝදර කොටස්වල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පාලනයේ පවතින හෙක්ටයාර් 202 හෝ ඊට ආසන්න භූමි ප්‍රමාණයක් තුළ, වන සංරක්ෂණ ආඥා පනතේ 20(1) (ඊ) හා (ඔ) වගන්ති යටතේ දක්වා ඇති තහනම් කරන ලද ක්‍රියාවන් සිදු කිරීමට නෙල්නා ඇග්‍රෝ ඩිවලොප්මන්ට් යන නමින් පවත්වා ගෙන යන පුද්ගලික සමාගමකට හෝ සමාගම් කිහිපයකට ඉඩ ලබා දීම තුළින් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වැරදි සම්බන්ධ පළමු උපලේඛනයේ 09 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.***

*II.* ***ඔබ, මොනරාගල දිසාවේ වැල්ලවාය අඩවියේ වැල්ලවාය හා බුත්තල බීට්ටුවලට අයත් වන්දම දෙමලිය රජයේ කැලයේ ඉඩම්වලින් අනවසර කරුවන් ඉවත් කිරීම සඳහා හෝ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීම සඳහා හෝ අංක 1979 අංක 7 දරණ රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත අනුව කටයුතු නොකිරීමෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වැරදි සම්බන්ධ පළමු උපලේඛනයේ 09 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.***

*III.* ***ඔබ, මොනරාගල දිසාවේ වැල්ලවාය අඩවියේ වැල්ලවාය හා බුත්තල බීට්ටුවලට අයත් වන්දම දෙමලිය රජයේ කැලයේ කුඩාඔය හා දොමෝදර කොටස්වල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පාලනයේ පවතින හෙක්ටයාර් 202 හෝ ඊට ආසන්න භූමි ප්‍රමාණයක් තුළ, වන සංරක්ෂණ ආඥා පනතේ 20 (1) (ඕ) වගන්ති යටතේ දක්වා ඇති තහනම් කරන ලද ක්‍රියාවන් සිදු කිරීමට නෙල්නා ඇග්‍රෝ ඩිවලොප්මන්ට් යන නමින් පවත්වා ගෙන යන පුද්ගලික සමාගමකට හෝ සමාගම් කිහිපයකට ඉඩ ලබා දීම තුළින් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වැරදි සම්බන්ධ පළමු උපලේඛනයේ 09 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.***

*IV.* ***ඔබ, මොනරාගල දිසාවේ වැල්ලවාය අඩවියේ වැල්ලවාය හා බුත්තල බීට්ටුවලට අයත් වන්දම දෙමලිය රජයේ කැලයේ කුඩාඔය හා දොමෝදර කොටස්වල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පාලනයේ පවතින හෙක්ටයාර් 202 හෝ ඊට ආසන්න භූමි ප්‍රමාණයක් තුළ, වන සංරක්ෂණ ආඥා පනතේ 20 (1) (ග) වගන්ති යටතේ දක්වා ඇති තහනම් කරන ලද ක්‍රියාවන් සිදු කිරීමට නෙල්නා ඇග්‍රෝ ඩිවලොප්මන්ට් යන නමින් පවත්වා ගෙන යන පුද්ගලික සමාගමකට හෝ සමාගම් කිහිපයකට ඉඩ ලබා දීම තුළින් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වැරදි සම්බන්ධ පළමු උපලේඛනයේ 09 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.***

*V.* ***ඔබ, මොනරාගල දිසාවේ වැල්ලවාය අඩවියේ වැල්ලවාය හා බුත්තල බීට්ටුවලට අයත් වන්දම දෙමලිය රජයේ කැලයේ කුඩාඔය කොටසේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පාලනයේ පවතින හෙක්ටයාර් 202 හෝ ඊට ආසන්න භූමි ප්‍රමාණයක් දෙපාර්තමේන්තු අවසරයකින් තොරව බලයලත් මිනින්දෝරුවෙක් මඟින් මැනීම් කිරීමේ දී එය වැළැක්වීමට කටයුතු නොකිරීමෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක පී.එම්./01/2007(01) හි සඳහන් විධිවිධාන උල්ලංඝනය කිරීමෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වැරදි සම්බන්ධ පළමු උපලේඛනයේ 15 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.***

*VI.* ***ඔබ, මොනරාගල දිසාවේ වැල්ලවාය අඩවියේ වැල්ලවාය හා බුත්තල බීට්ටුවලට අයත් වන්දම දෙමලිය රජයේ කැලයේ කුඩාඔය හා දොමෝදර කොටස්වල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පාලනයේ පවතින හෙක්ටයාර් 202 හෝ ඊට ආසන්න භූමි ප්‍රමාණයක් එළිකර එම භූමි ප්‍රමාණය තුළ, නෙල්නා ඇග්‍රෝ ඩිවලොප්මන්ට් යන නමින් පවත්වා ගෙන යන ආයතනයේ නිලධාරීන් විසින් දිගින් දිගටම සිදුකරන ලද ඉදිකිරීම් සම්බන්ධයෙන් තම උසස් නිලධාරීන්ට දැන්වීමට කටයුතු නොකිරීම තුළින් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වැරදි සම්බන්ධ පළමු උපලේඛනයේ 09 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.***

*VII.* ***ඔබ, මොනරාගල දිසාවේ වැල්ලවාය අඩවියේ වැල්ලවාය හා බුත්තල බීට්ටුවලට අයත් වන්දම දෙමලිය රජයේ කැලයේ කුඩාඔය හා දොමෝදර කොටස්වල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පාලනයේ පවතින හෙක්ටයාර් 202 හෝ ඊට***

*ආසන්න භූමි ප්‍රමාණයක් එළිකර එම භූමි ප්‍රමාණය තුළ, නෙල්නා ඇග්‍රෝ ඩිවලොප්මන්ට් යන නමින් පවත්වා ගෙන යන ආයතනයේ නිලධාරීන් විසින් දිගින් දිගටම සිදුකල ඉදිකිරීම් වැළැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ගයන් පිළිබඳව සිය අධීක්ෂණය යටතේ සිටින පහළ නිලධාරීන්ට උපදෙස් ලබා නොදීම මගින් ඔබට පැවරී ඇති රාජකාරි ඉටු නොකිරීමෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 1:2 වගන්තිය උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කිරීමෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වැරදි සම්බන්ධ පළමු උපලේඛනයේ 15 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.*

VIII. *ඔබ, මොනරාගල දිසාවේ වැල්ලවාය අඩවියේ වැල්ලවාය හා බුත්තල බීට්ටුවලට අයත් වන්දම දෙමලිය රජයේ කැලයේ කුඩාඔය හා දොමෝදර කොටස්වල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පාලනයේ පවතින හෙක්ටයාර් 202 හෝ ඊට ආසන්න භූමි ප්‍රමාණයක් නෙල්නා ඇග්‍රෝ ඩිවලොප්මන්ට් යන නමින් පවත්වා ගෙන යන පෞද්ගලික ආයතනයේ ඉල්ලීම පරිදි නිදහස් කිරීමට කටයුතු කිරීමේ දී දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක පී.එම්./01/2007(01) හි සඳහන් විධිවිධාන උල්ලංඝනය කිරීමෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වැරදි සම්බන්ධ පළමු උපලේඛනයේ 15 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.*

IX. *ඔබ ඉහත අංක I සිට VIII දක්වා චෝදනාවල සඳහන් වැරදි එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම සිදුකිරීමෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 10 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.*

අභියාචක ඔහුගේ විශ්‍රාම වයස එළඹෙන අවස්ථාව වන විටත්, මෙම කරුණට අදාළව වන විධිමත් විනය පරීක්ෂණය, ඔහුට විරුද්ධව පවත්වා ගෙන යමින් තිබූ හෙයින්, ඔහුව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ 12 වන වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීමට නිර්දේශ කර ඇත. එම නිර්දේශය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් 2023.05.22 දිනැති ලිපිය මගින්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දී ඇත.

මෙම තත්ත්වය යටතේ මෙහිදී තීරණය කළ යුතු වන්නේ විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව, එම පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා විසින් ගෙන ඇති තීරණයෙහි නිරවද්‍යතාවයයි. ඉහතින් සඳහන් 05 වන චෝදනාවෙන් අභියාචක නිදහස් කර ඇති හෙයින්, ඒ සම්බන්ධයෙන් දඬුවමක් පනවා නොමැති නිසා, 05 වන චෝදනාවට අදාළව ඉදිරිපත් කර ඇති කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය නොවේ.

ඉහතින් සඳහන් 1, 3, සහ 7 යන චෝදනා මගින් ඔප්පු කිරීමට උත්සාහ කර ඇත්තේ, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවතින භූමි ප්‍රමාණයක් තුළ, වන සංරක්ෂණ ආඥා පනත යටතේ වන වැරදි ක්‍රියා සිදුකිරීමට ‘‘නෙල්නා ඇග්‍රෝ ඩිවලොප්මන්ට්‘‘ යන සමාගමට අභියාචක විසින් ඉඩ ප්‍රස්ථා ලබාදී තිබීමයි. නීති විරෝධී ක්‍රියා ලෙසට සැළකෙන, ස්වභාවික වනය තුළ තිබූ ගස්

කොළන් කපා ඉවත් කර අඹ පැල සිටුවා තිබීම හා එම ස්ථානයේ ගොඩනැගිලි තැනීම යන කරුණු සම්බන්ධයෙන්, එම ක්‍රියාවන්හී නියුතුව සිටි අයට විරුද්ධව කටයුතු නොකර තිබීමෙන්, අභියාචක ඔහුගේ රාජකාරිය ඉටුකර නොතිබීමයි.

එකී වනහානි සිදුකර තිබීම හා අනවසර ගොඩනැගිලි ඉදිකිරීම යන කරුණු විවාදයට ලක්වී නැත. එසේ නම් රජයට අයත් වූ ඉහත කී ස්ථානය එම තත්ත්වයට උදා කරලීම සඳහා අභියාචක විසින් පහසුකම් සළසා දී තිබේද, නොඑසේ නම් ඒ සම්බන්ධයෙන් වන රාජකාරීමය ස්වභාවයෙන් යුත් කටයුතු නොකර හැරීමක් අභියාචක අතින් සිදුවි ඇත්ද යන්න සාක්ෂි වලින් තහවුරු වී තිබිය යුතුය. මේ සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණ පැවැත්වූ නිලධාරීයාගේ වාර්තාව කෙරෙහි අවධානය යොමු කරන ලදි. එම වාර්තාවේ මෙසේ සඳහන් වේ.

> ***"මෙම පරීක්ෂණයේ දී සාක්ෂි ලබා දුන් එවකට වැල්ලවාය අඩවි වන නිලධාරී වශයෙන් සේවය කරන ලද ඩබ්ලිව්.එච්.එම්.විපීතසිරි බණ්ඩාර, බුත්තල බීට්ටු වන නිලධාරී (හිටපු) ආර්.නමිල සඳරුවන් සහ පැල්වත්ත වන ක්ෂේත්‍ර සහකාර (හිටපු) විපුල් සුසන්ත යන අයගේ සාක්ෂි වලට අනුව මෙම පරීක්ෂණයට අදාළ ඉඩම තුළ කැලය එළිකිරීමක් සම්බන්ධයෙන් 2012.06.18 වන දින ලද තොරතුරක් අනුව වැටලීමක් සිදු කොට ඇත. මෙම වැටලීම සිදුකරන ලද අවස්ථාවේ දී මෙම ඉඩමේ හෙක්ටයාර් 6ක් පමණ භූමි ප්‍රමාණයක් එලිකර ඇති බවත්, අක්කර 2ක පමණ අඹ පැල සිටුවා ඇති  බවත්, ඉඩම වටා විදුලි වැටක් ඉදි කිරීමට අවශ්‍ය කටයුතු කරමින් තිබෙනවාත් ඩෝසරයකින් මෙම ඉඩම සුද්ධ කරනවාත් නිරීක්ෂණය කර ඇත. අදාළ එළි කිරීම් කටයුතු නෙල්නා ඇග්‍රි සංවර්ධන සමාගම විසින් සිදුකරන බවට අනාවරණය වී ඇති අතර, එම අවස්ථාවේ දී ඉඩම එළි කිරීමට යොදා ගත් ඩෝසර් යන්ත්‍රය, එහි රියදුරු සහ අධීක්ෂණ නිලධාරියෙකු අත් අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර, අධිකරණය හමුවේ අදාළ චෝදනා වලට වරද පිළිගැනීමෙන් අනතුරුව එම පුද්ගලයින්ට දඩ නියම කොට ඇත. මෙම සිද්ධියට අදාළ වන අපරාධ වාර්තාව දිසා වන නිලධාරී මොනරාගල වෙත 2012.06.20 වන දින ඉදිරිපත් කොට ඇති අතර, එම වන අපරාධ වාර්තාව පැ.11 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කොට ඇත. පැල්වත්ත ක්ෂේත්‍ර නිලධාරී (හිටපු) විපුල් සුසන්ත මහතාට අනුව ඔහු මෙම සිද්ධියෙන් සති 02 කට පමණ පසුව අදාළ ඉඩම පරීක්ෂාවට ගොස් ඇති අතර, එම ඉඩමේ තවදුරටත් අඹ පැල සිටුවා ඇති බව දක ඇති අතර, ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග කටයුතු සිදුකර තිබූ නිසා ඒ පිළිබඳව නැවත නීතිමය ක්‍රියාමාර්ග ගෙන නැත. ඔහු විසින් මූලික විමර්ශනයේ දී ලබා දී ඇති පැ.3 ප්‍රකාශයෙහි ඔහු සඳහන් කර ඇත්තේ උක්ත අත් අඩංගුවට ගැනීමෙන් පසුව නඩුව පවත්වා ගෙන යන අතරතුර එම ප්‍රදේශයේ විදුලි වැට ඉදි කිරීමත්, එළි කිරීමත්, අඹ පැල සිටුවීමත් දිගටම සිදුවූ බවත් ඔහුගේ දැනීමේ හැටියට හෙක්ටයාර් 200 ක් පමණ කොටසක වගා කර විදුලි වැට***

*ඉදි කර ඇති බවය. ඔහු වැඩිදුරටත් සඳහන් කොට ඇත්තේ ඒ සම්බන්ධයෙන් බීට්ටු වන නිලධාරීව දැනුවත් කළ බවය. ඒ අනුව 2012.06.18 වන දින සිදුකරන ලද වැටලීමෙන් පසුව පුද්ගලයන් අත් අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර තිබියදී පවා ඉහත කී නෙල්නා සමාගම විසින් මෙම ඉඩමේ සංවර්ධන කටයුතු දිගින් දිගටම පවත්වාගෙන ගොස් ඇති බව පැහැදිලිවම තහවුරු වේ.*

*වැල්ලවාය හිටපු අඩවි වන නිලධාරී විජිතසිරි බණ්ඩාර මහතාගේ සාක්ෂියට අනුව ඔහු 2012.06.18 වන සිදුවීමෙන් මාස 6කට පමණ පසුව නිලධාරීන් සමඟ මෙම ඉඩම පරීක්ෂා කිරීමට ගොස් ඇත. එසේ යන අවස්ථාවේ දී මුලින් අඹ වගා කර තිබූ ප්‍රමාණයට වඩා හෙක්ටයාර් 100ක් පමණ අඹ වගා කර තිබූ බවත්, අලි වැට සම්පූර්ණයෙන් ඉදිකොට තිබූ බවත් දැක ඇත.*

*මේ පිළිබඳව මේ සාක්ෂිකරු එවකට දිසා වන නිලධාරී වශයෙන් සේවය කළ චූදිත නිලධාරීට දැනුම් දී ඇත. මෙම සාක්ෂිකරු විසින් ලබා දී ඇති පැ.5 ප්‍රකාශයට අනුව මේ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියා මාර්ග පිළිබඳව චූදිත නිලධාරී සමඟ සාකච්ඡා කොට ඒ පිළිබඳව උපදෙස් පතා ඇත. එහිදී චූදිත නිලධාරී මෙම සාක්ෂිකරු වෙත පවසා ඇත්තේ, මේ සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයෙන් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බවයි. එහෙත් ඒ සම්බන්ධයෙන් ඔහුට චූදිත නිලධාරීගෙන් උපදෙස් ලැබුනේ නැති බව මෙම සාක්ෂිකරුගේ ස්ථාවරය විය. මෙම සාක්ෂිකරු පැ.5 ප්‍රකාශයෙහි ඒ පිළිබඳව සඳහන් කර ඇත්තේ මෙම ඉඩම සම්බන්ධව නිර්දේශ යවා ඇති බවත්, උපදෙස් ඉල්ලා ඇති බවත්, ලැබෙන උපදෙස් අනුව ඉදිරි ක්‍රියා මාර්ගයන් ගැනීමට උපදෙස් දෙන බවත්, චූදිත නිලධාරී පැවසූ බවය. කෙසේ වුවද මෙම සාක්ෂිකරුට අනුව ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව චූදිත නිලදාරීගෙන් කිසිදු උපදෙසක් ලැබී නැත.*

*මෙම සාක්ෂිකරුට අනුව 2012.06.18 වන දින සිද්ධියෙන් පසුව මෙම පරීක්ෂණයට අදාළ ඉඩම නිරීක්ෂණය කිරීම සඳහා ගිය අවස්ථාවේ දී මෙම ඉඩම එළි පෙහෙළි කොට හෙක්ටයාර් 100ක පමණ අඹ වගා කොට ඇති බවත්, විදුලි වැටක් සාදා ඇති බවත් නිරීක්ෂණය කළ බවත්, ඒ පිළිබඳව චූදිත නිලධාරීට දැනුම් දී ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග මොනවාද යන්න වාචිකව චූදිත නිලධාරීගෙන් විමසූ බවත් ඒ අවස්ථාවේ දී චූදිත නිලධාරී ඒ පිළිබඳව ප්‍රධාන කාර්යාලයෙන් විමසා ගත යුතු ක්‍රියා මාර්ග කුමක්ද යන්න මෙම සාක්ෂිකරුට කියා සිටි බවට ඔහු විසින් මෙම පරීක්ෂණයේ දී ලබාදුන් සාක්ෂිය චූදිත නිලධාරී විසින් කිසිදු හබයකට හෝ අභියෝගයට ලක් කලේ නැත. ඒ අනුව මෙම සාක්ෂිකරු විසින් 2012.06.18 වන දින සිද්ධියෙන් පසුව අදාළ ඉඩම තුළ නෙල්නා ඇග්‍රි සමාගම විසින් සිදු කරමින් තිබූ ක්‍රියාකාරකම් නැතහොත් ඉඩම් එළි කිරීම, අඹ වගා කිරීම, විදුලි වැට ඉදිකිරීම ආදී කටයුතු නෙල්නා ඇග්‍රි සමාගම විසින් දිගින් දිගටම පවත්වා ගෙන ගිය බව චූදිත නිලධාරීට දැනුම් දී ඇති බව මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් මනාව ඔප්පු වී ඇත."*

ඉහත සාක්ෂි වලට අමතරව, නෙල්නා සමාගම වෙත මෙම ඉඩම් කොටස ලබා දීම සඳහා අභියාචක විසින් විශේෂ උනන්දුවක් දක්වමින් කටයුතු කර තිබූ බවට ද පැහැදිලි සාක්ෂි ඉදිරිපත් වන බව, ඉහත සඳහන් විධිමත් විනය පරීක්ෂණ වාර්තාව අනුව පැහැදිලිවේ.

අභියාචකට විරුද්ධව ඉදිරිපත් කර තිබූ II චෝදනාව සම්බන්ධයෙන් ඉහත කී පරීක්ෂණ නිලධාරියාගේ වාර්තාවෙහි ඇතුළත්ව ඇති කරුණු කෙරෙහි ද අවධානය යොමු කරන ලදි. එහි සඳහන් කර ඇත්තේ, පැ.11 ලෙස සාක්ෂි මඟින් ඉදිරිපත් කර ඇති ලේඛනයේ සඳහන් පරිදි, මෙම කරුණට විෂය වූ ස්ථානයේ පවත්වා ගෙන ගිය නීති විරෝධි ක්‍රියා සම්බන්ධයෙන් අභියාචක වෙත දැනුම් දීමක් කර තිබූ බවට පැහැදිලිව සාක්ෂි ඉදිරිපත් වී ඇති බවයි. එම තත්ත්වය අභියාචක වුවද විවාදයට භාජනය නොකරයි. එම ලිපියේ දිනය 2012.06.20 දින වේ. එම ලේඛනය සකස් කර ඇති අඩවි වන නිලධාරී ඩබ්.එච්.එම්.විජිතසිරි බණ්ඩාර විසින් දිසා වන නිලධාරී (මොනරාගල) වන අභියාචක වෙත, එම වාර්තාව ඉදිරිපත් කර ඇත. එහි පැහැදිලිව සඳහන් කර ඇත්තේ එම ප්‍රදේශය "චන්දම රජයේ කැලයට" අයත් බවත්, එම කොටසේ තිබූ කැලය, ඩෝසර් යන්ත්‍රයක් මඟින් එළි කරමින් සිටි පුද්ගලයින් දෙදෙනෙකු අත් අඩංගුවට ගනු ලැබූ බවත්ය. එසේ අත් අඩංගුවට ගනු ලැබූ පුද්ගලයින් දෙදෙනා අධිකරණයට ඉදිරිපත් කර තිබූ අතර, ඔවුන්ට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනාවන්ට ඔවුන් වරදකරු බවට පත්කර ඇත.

එවැනි තත්ත්වයන් යටතේ ඉහත කී පැ.11 ලෙස ඉදිරිපත් කරන ලද ලිපිය ලැබුණ වහාම අභියාචක ක්‍රියාත්මක වී, නීත්‍යානුකූලව පියවර ගත යුතුව තිබුණි. ඒ සඳහා රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ වන මූලික පියවර ගැනීමට කටයුතු කිරීම අභියාචකගේ වගකීම වනවා ඇත. විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා සඳහන් කර ඇත්තේ, චූදිත නිලධාරියා විසින් මේ පිළිබඳව නීතිමය පියවර ගතයුතු බවට සටහන් යොදා ඇති නමුත්, (X.10 ලේඛනය අනුව) රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ ඉදිරි පියවර ගැනීම සඳහා අඩවි වන නිලධාරීන්ට, අභියාචක විසින් පැහැදිලි නියෝගයක් කර නොමැති බවයි. තවද, අභියාචක වෙත ඉදිරිපත් තිබූ පැ.11 දරණ ලේඛනය එනම්, 2012.06.20 දිනැති ලේඛනය අභියාචක වෙත ලැබී තිබුණද, එහි සඳහන් වන අපරාධය සම්බන්ධයෙන් නඩු පවරා ඇත්තේ, 2012.09.12 වෙනි දිනදීය. ඒ අනුව දීර්ඝ කාලයක් තිස්සේ නඩු පැවරීමක් සිදුකර නොමැති බවක් ද පෙනී ගොස් ඇත.

V වන චෝදනාව ඔප්පු වී නොමැති බැවින්, එම චෝදනාවෙන් අභියාචක නිදහස් කර ඇත.

VI වන චෝදනාවේ හරය වන්නේ ඉහතින් සඳහන් කර ඇති, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින භූමි ප්‍රමාණයක් එළිකිරීම සම්බන්ධයෙන් උසස් නිලධාරීන්ට දැන්වීමට අභියාචක විසින් කටයුතු කර නොතිබීමයි. ඉහත කී පැ.11 දරණ ලේඛනය අභියාචක වෙත ලැබීමෙන් අනතුරුව, ඒ සම්බන්ධයෙන් උසස් නිලධාරීන් දැනුවත් කළ බව සනාථ කිරීම සඳහා කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නැත. අභියාචක පවසා ඇත්තේ, ඒ සම්බන්ධයෙන් ඔහු අදාළ සුදුසු පියවර ගත් බව, X.10 දරණ ලේඛනයෙන් පැහැදිලි වන බවයි. එකී X.10 දරණ ලේඛනයට, විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියාගේ අවධානය යොමු වී ඇත. එහි සඳහන් කරුණු ඔහු විසින් පරීක්ෂා කර බලා ඇති බවත්, එම ලේඛනය අනුව අභියාචක නිසි පියවර ගෙන ඇති බවක් ඔප්පු නොවන බවටත් ඔහු විසින් සඳහන් කර ඇත.

අංක VII දරණ චෝදනා සම්බන්ධයෙන් ද, ඉහත කී පරීක්ෂණ නිලධාරියා විසින් ඔහුගේ තීරණයට හේතුන් පැහැදිලිව සඳහන් කර ඇත. විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා විසින් අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා සම්බන්ධයෙන් ඔහු වැරදිකරු බවට තීරණය කරන ලද්දේ කුමන හේතුන් නිසාදැයි ඔහුගේ වාර්තාවේ පැහැදිලි කර ඇත. එහි මෙසේ සඳහන් වේ.

> "***චූදිත නිලධාරි මොනරාගල දිසාවේ දිසා වන නිලධාරි වශයෙන් 2009 ජනවාරි සිට 2015 පෙබරවාරි අතර කාලය තුළ සේවය කොට ඇත. ඉදිරිපත් වූ සාක්ෂි අනුව ඔහු තමාගේ අධීක්ෂණය යටතේ සේවය කරනු ලබන ක්ෂේත්‍ර නිලධාරීන්ව අධීක්ෂණය කිරීමේ වගකීම දෙපාර්තමේන්තුව විසින් ඔහු වෙත පවරා ඇත. මෙම පරීක්ෂණයට අදාළ විෂය ගත ඉඩම තුළ පෙර සඳහන් කළ පරිදි නෙල්නා ඇග්‍රි ඩිවලොප්මන්ට් සමාගම විසින් දිගින් දිගටම සිදු කළ ඉදිකිරීම්, වගා කටයුතු, යන්ත්‍රානුසාරයෙන් ඉඩම එළිකිරීම ආදී ක්‍රියාවන් වැළැක්වීම සඳහා ගතයුතු ක්‍රියා මාර්ග පිළිබඳව ඔහුගේ අධීක්ෂණය යටතේ සේවය කරන ලද ක්ෂේත්‍ර නිලධාරීන්ට කිසිදු විධිමත් උපදෙස් ලබාදීමක් සිදුකර නොමැති බව මෙම පරීක්ෂණයේ දී ඉදිරිපත් වූ සාක්ෂි මගින් පැහැදිලි ලෙස ඔප්පු වී ඇත.***"

අංක VIII දරණ චෝදනාවට අභියාචක වරදකරු බවට පත් කිරීමට හේතුවූ කරුණු මොනවාද යන්නත්, ඔහුගේ වාර්තාවේ පහත අන්දමින් සඳහන් කර ඇත.

> **"මෙම පරීක්ෂණයේ දී ඉදිරිපත් වූ සාක්ෂි වලට අනුව පැ.15 ඉල්ලීමට අදාළව වන සංරක්ෂක ජනරාල්වරයාගේ කිසිදු විමසීමකින් තොරව චූදිත නිලධාරී අඩවි වන නිලධාරීගෙන් ඔහුගේ නිර්දේශ සහිත වාර්තාවක් කැඳවා ඉන් අනතුරුව අදාළ ඉල්ලීමට අනුව හෙක්ටයාර් 200ක පමණ භූමි ප්‍රමාණයක් අදාළ සමාගම වෙත දීර්ඝ කාලීන බදු පදනම යටතේ ලබාදීම සඳහා ඉඩම් කොමසාරිස්**

**දෙපාර්තමේන්තුවට මුදාහරින ලෙසට පෑ.18 මගින් නිර්දේශයක් ලබා දී ඇත. මෙම චක්‍රලේඛයට අනුව ඉඩම ලබාදිය යුතු වන්නේ වන සම්පත් සංවර්ධන මෙහෙයුම් සඳහාය. කෘෂි කාර්මික කටයුතු සඳහා පමණක් ඉඩම් ලබාදිය නොහැකි බව ද එහි සඳහන්ව ඇත. කෙසේ වුවද චූදිත නිලධාරී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පාලනය යටතේ පවතින වන්දම දෙමලිය රජයේ කැලයේ හෙක්ටයාර් 200ක පමණ භූමි ප්‍රමාණයක් නෙල්නා ඇග්‍රි ඩිවලොප්මන්ට් සමාගමට බදු පදනම යටතේ ලබදීමට නිර්දේශ කර ඇත්තේ කෘෂිකාර්මික කටයුත්තක් සඳහා පමණක් වන බව සාක්ෂි මත සනාථ වී ඇත. ඒ අනුව ස්ථිර කෘෂි වගාවක් සිදු කිරීම සඳහා අදාළ ඉඩම් ලබාදීමට නිර්දේශ කර ඇත.**"

IX චෝදනාව අනික් චෝදනා ඔප්පු වීම මත රඳා පවතී.

ඉහතින් සඳහන් කර ඇති පරිදි විධිමත් විනය පරීක්ෂණයේ දී, ඉදිරිපත්ව තිබූ සාක්ෂි පැහැදිලිව විශ්ලේශනය කරමින්, පරීක්ෂණ නිලධාරියා විසින් ඔහුගේ තීරණයන්ට එළඹුනේ කුමන හේතූන් නිසාදැයි, ඔහු විසින් වෙන් වෙන්ව සඳහන් කර ඇත. තවද, එම සාක්ෂි පිළිගනිමින්, ඔහු ඒ මත ක්‍රියාකර ඇත්තේ කුමන හේතූන් නිසාදැයි පරීක්ෂණ වාර්තාවේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

කිසියම් පුද්ගලයෙකුට එරෙහිව චෝදනා එල්ල කිරීමෙන් අනතුරුව එම චෝදනා ඔප්පු වී තිබේද යන කරුණු තීරණය කිරීම සඳහා, දෙපාර්ශවයේ සහභාගීත්වයෙන් යුතුව මෙන්ම, කිසියම් අධිකරණ හෝ අර්ධ අධිකරණ කටයුත්තකදී, චූදිතයකු සතුවන අයිතිවාසිකම් ද ආරක්ෂා කරමින් පවත්වනු ලැබූ මූලික විභාගයකින් අනතුරුව ගනු ලැබූ තීරණයක්, නැවත සළකා බැලීම සඳහා අභියාචනාවක් ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී, අභියාචනය විභාගයට ගන්නා විනිශ්චයාසනය විසින් කටයුතු කළයුතු ආකාරය උපරිමාධිකරණ නඩු තීන්දු බොහොමයකින් පැහැදිලිව දක්වා ඇත.

එම තීන්දු වල සඳහන් කර ඇත්තේ, කිසියම් අභියාචනයක් විභාගයට ගත් අවස්ථාවේ දී, එම සිද්ධියට අදාළ සිද්ධිමය කරුණු විශ්ලේෂනය කරමින් ඒ සම්බන්ධයෙන් මැදිහත් වී, මුල් අවස්ථා විනිශ්චය සභාව විසින් ගනු ලැබ ඇති තීරණයක් වෙනස් කරන්නේ නම්, එය ඉතා පරිස්සමෙන් කළ යුතු බවයි. ඒ සම්බන්ධයෙන් වන අධිකරණ තීන්දු වලට මේ අවස්ථාවේ දී විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරන ලදී.

මේ සම්බන්ධයෙන් වන "**වික්‍රමාරච්චි කොළඹගේ** එරෙහිව **කේ.ඒ.නන්දන කුරුප්පු**, SC Appeal **202/2015** දරණ නඩුවේ **2018.10.10** දිනැති තීන්දුවේ මෙසේ සඳහන් කර ඇත.

"***The Appellate courts are reluctant to interfere with the findings of the Trial Courts including the Labour Tribunal unless a serious miscarriage of***

*justice has taken place when the Tribunal was analyzing the evidence and the law relating to its findings.*

*Jayasuriya Vs. Sri Lanka State Plantation Corporation 1995 2 Sri LR 379 at 391,* ***නඩු තීන්දුවේ අමරසිංහ විනිසුරුතුමා මෙසේ සඳහන් කර ඇත.***

*While Appellate Courts will not intervene with pure finding of fact, yet if it appears that, the tribunal has made a finding wholly unsupported by the evidence or Which is inconsistent with the evidence and contradictory of or Where the tribunal has failed to consider material and relevant evidence or Where it has failed to decide a material question or misconstrued the question and has directed its attention to the wrong matters or Where there was an erroneous misconception amounting to a misdirection or Where it failed to consider material documents or misconstrued them or Where the tribunal has failed to consider the version of one party or his evidence or erroneously supposed there was no evidence, the finding of the tribunal is subject to review by the Court of Appeal."*

**කමලසිරි සහ තවත් දෙදෙනෙකු** එරෙහිව **නීතිපති**, *2015 01 SLR 125 - CA 293/2012*

*It was held that the credibility of a witness—including explanations for the delay in complaint—remains a factual question for the trial judge, and appellate intervention is warranted only where findings are clearly unreasonable or unsupported.*

*It was further found that appellate review of those factual determinations is limited and should only occur if such findings are clearly unsupportable.*

***අල්විස් එරෙහිව පියසේන ප්‍රනාන්දු,***

*1993 01 SLR 119 - SC NO. 30/92 - Sri Lanka Law Reports*

*It was determined that the burden of proof for prescriptive title rests with the defendant, and that appellate interference with trial-level findings—particularly those involving witness credibility and primary facts—is warranted only in exceptional circumstances. The decision reaffirmed the principle that factual findings by the trial judge should not be overturned on*

***appeal without compelling reason. Reliance was placed on established authority regarding burdens of proof and appellate deference. Restoring the judgment of the original trial court, the judgment emphasized the sanctity of factual determinations and clarified that mere documentary assertions of use were insufficient to satisfy the prescription requirement.***

***G. P. S. de Silva, C.J. — The findings established that the burden of proving acquisition of title by prescription lies with the defendant. It was determined that the trial judge, having seen and heard the witnesses, is best placed to assess their credibility and factual assertions, and such primary findings should not be disturbed on appeal without demonstrable error.***

***පීපල්ස් ලීසිං කම්පැනි එරෙහිව වන නිලධාරී,***

***CA [PHC} APN 106/2013***

***The factual findings of the lower courts, which relied on the absence of testimony from the registered owner, were found to have been reached on proper evidence and in accordance with legal standards. No basis for appellate intervention was found, and the prior orders were affirmed, dismissing the appeal with costs.***

***Fradd v. Brown & Co., Ltd.***

***20 NLR 282***

***It was determined that appellate interference with a trial judge's explicit factual findings is seldom warranted, as the trial judge benefits from having observed the witnesses firsthand.***

***It was determined that appellate courts should rarely disturb such factual findings unless clear error is shown, reaffirming the principle that direct observation of witnesses by the trial judge is decisive in matters of factual assessment.***

මෙම නීතිමය තත්ත්වය, පොදු නීතිය බලාත්මක වන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් තුළත් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වන බව පහත සඳහන් අධිකරණ තීන්දු මගින් පැහැදිලි වේ.

"***Henderson v. Foxworth Investments Ltd [2014]***
***UKSC 41, where Lord Reed held at[67]***

> ***"... in the absence of some other identifiable error, such as (without attempting an exhaustive account) a material error of law, or the making of a critical finding of fact which has no basis in the evidence, or a demonstrable misunderstanding of relevant evidence, or a demonstrable failure to consider relevant evidence, an appellate court will interfere with the findings of fact made by a trial judge only I it is satisfied that his decision cannot reasonably be explained or justified".***

***In Fage UK Ltd v. Chobani UK Ltd [2014] EWCA Civ 5 at [114] Lewison LJ***

> ***"Appellate courts have been repeatedly warned, by recent cases at the highest level, not to interfere with findings off act by trial judges, unless compelled to do so ... The expertise of a trial judge is in determining what facts are relevant to the legal issues to be decided, and what those facts are if they are disputed. The trial is not a dress rehearsal. It is the first and last night of the show. Duplication of the trial judge's role on appeal is a disproportionate use of the limited resources of an appellate court, and will seldom lead to a different outcome in an individual case. In making his decisions the trial judge will have regard to the whole of the sea of evidence presented to him, whereas an appellate court will only be island hopping".***

ඉහත කී නීතිමය තත්ත්වය සළකා බැලීමේ දී පැහැදිලිව පෙනී යන්නේ, මුල් අවස්ථා විනිශ්චය සභාවක් විසින් ලබා දී ඇති තීන්දුවක්, ඉහළ විනිශ්චය සභාවක් විසින් සළකා බලන අවස්ථාවකදී, නඩුවට අදාළ සිද්ධිමය කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් වූ සාක්ෂි විමර්ශනය කර, මුල් අවස්ථා විනිශ්චය සභාව ගෙන ඇති තිරණය වෙනස් කරන්නේ නම්, එය ඉතා පරීක්ෂාකාරීව සිදුකළ යුතු බවයි. මුල් අවස්ථා විනිශ්චය සභාව,

- **සිද්ධිමය කරුණු වරදවා වටහා ගෙන ඇති බව පැහැදිලිව පෙනී යන්නේ නම් හෝ;**
- **අදාළ සාක්ෂි වැරදි ලෙස වටහා ගෙන තිබේ නම් හෝ;**
- **එළඹ ඇති තීරණය පදනම් විරහිත වන්නේ නම් හෝ;**
- **ලබා දී ඇති තීරණයන් සාක්ෂි මගින් සනාථ නොවන්නේ නම් හෝ;**

යන විශේෂ අවස්ථාවලදී පමණක්, අභියාචනා විනිශ්චය සභාව විසින් මුල් අවස්ථා විනිශ්චය සභාවේ තීරණයට මැදිහත් වීම කළ යුතු බවයි.

අප ඉදිරියේ පවතින මෙම අභියාචනයට අදාළව, මුල් අවස්ථා විනිශ්චය සභාව විසින් ලබා දී ඇති විස්තරාත්මක හා විශ්ලේෂණාත්මකවූ අවසාන වාර්තාව සළකා බැලීමෙන් පැහැදිලිව පෙනී යන්නේ, එකී විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා විසින්, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා සහ ඒවා ඔප්පු කිරීමට අදාළ කරගත් සාක්ෂි ද, මනා අවබෝධයකින් යුතුව සළකා බලා ඇති බවයි. අභියෝගයට ලක්කර ඇති තීරණයට එළඹීමේ දී, ඔහු කිසිවිටෙක අනවශ්‍ය සාක්ෂි සළකා බැලීමක් කර තිබීමක් හෝ පදනම් විරහිත තීරණයකට හෝ එළඹී නැත. තවද, මෙම අභියාචනයේ දී ඉදිරිපත් වී ඇති කරුණු සළකා බැලීමේ දී, නීති සිද්ධාන්ත නොසළකා කටයුතු කර ඇති බවක්ද නොපෙනේ.

තවද, විධිමත් විනය පරීක්ෂණය පවත්වන ලද නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවෙහි දෝෂයක් තිබුණු බවක්, අභියාචක වෙනුවෙන් ඉදිරිපත් කරන ලද දේශන වලදී පෙන්වා ඇති බවක් ද පෙනී යන්නේ නැත.

චෝදනා ඉදිරිපත් කළ ආකාරය සම්බන්ධයෙන් කිසියම් දෝෂ සහගත තත්ත්වයක් පවතින බවට වූ නීතිමය ප්‍රශ්නයක්, මුල් අවස්ථාවේ දීම ඉදිරිපත් කර ඇතත්, පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා ඒ සම්බන්ධයෙන් නිගමනය කර ඇත්තේ, ඉදිරිපත් කර තිබූ චෝදනා හේතුවෙන්, අභියාචක නොමග ගොස් නොමැති නිසා, එම දෝෂයන් සළකා නොබැලිය යුතු බවයි. එම තීරණයෙහිද දෝෂයක් පෙනෙන්නට නැත.

අභියාචක වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරමින් පවසා ඇත්තේ, මෙම සිද්ධියට අදාළ කරුණු මත අභියාචකට වඩා ඉහළ මට්ටමින් සහ ඊට වඩා පහළ මට්ටමින් රාජකාරියේ නියැලුනු නිලධාරීන් හට කිසිදු චෝදනාවක් ඉදිරිපත් කර නොතිබූ බවයි. මෙම කරුණ කෙරෙහි අපගේ අවධානය යොමු කිරීමෙන් අනතුරුව, එසේ ක්‍රියා නොකර හැරීම සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන ලෙසට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත විනිශ්චය අධිකාරය විසින් දැනුම් දෙන ලදි. ඉන්පසුව ඉදිරිපත් කරන ලද ඔවුන්ගේ වාර්තාවේ සඳහන් කර ඇත්තේ, අභියාචකට ඉහළින් කටයුතු කළ ප්‍රධාන නිලධාරියා සම්බන්ධයෙන් වන විනය කටයුතු රාජ්‍ය සේවා

කොමිෂන් සභාව වෙත පැවරී නොමැති බවයි. තවද, නියෝජ්‍ය වන සංරක්ෂක එස්.ඒ.ඩී.කිංස්ලි යන අය සම්බන්ධයෙන් විනය පියවර ගැනීමට පදනමක් නොතිබූ බවයි. කෙසේ වෙතත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් දැනගත් පරිදි ඉහත කී එස්.ඒ.ඩී.කිංස්ලි යන අය 2021 වර්ෂයේ, එනම් මෙම අභියාචකට එරෙහිව විනය දඬුවම නියම කරන විටත් මියගොස් ඇත. මෙම අභියාචකට පහළ මට්ටමේ සිටි නිලධාරීන් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ගය ගැන එම වාර්තාවේ පැහැදිලි කර නැත.

කෙසේ වෙතත්, සිද්ධියට අදාළ වගකිවයුතු අනික් නිලධාරීන් සම්බන්ධයෙන් විනය කටයුතු නොකළ පමණින්, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනා වලින් ඔහුව නිදහස් කිරීම සඳහා එම කරුණු අදාළ කරගත නොහැක. මෙම කරුණ/තත්ත්වය කෙරෙහි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අවධානය යොමු කර ඇති නිසා, ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමේ වගකීම ඔවුන් වෙත පැවරෙනවා ඇත. ඒ අනුව මෙම කරුණට අදාළව වෙනත් නිලධාරීන් වගකිව යුතු බවට කරුණු ඉදිරිපත් කර ඇතත්, එම කරුණු සළකා බලා, අභියාචක වෙත ඉදිරිපත් කර ඇති චෝදනා වලින් ඔහුව නිදහස් කිරීමට මෙම විනිශ්චය අධිකාරය කැමැත්තක් දක්වන්නේ නැත.

ඉහතින් සඳහන් කරුණු සළකා බලා, මෙම විනිශ්චය අධිකාරය ඉදිරියේ පවතින අභියාචනා අවස්ථාවේ දී, මුල් අවස්ථා විනිශ්චය සභාව විසින් සිද්ධිමය කරුණු සළකා බලා ලබාදී ඇති තීරණය සම්බන්ධයෙන් මැදිහත්වීමට අප කැමැත්තක් දක්වන්නේ නැත. මේ අනුව, අභියාචක වෙත එල්ල කර තිබූ චෝදනා වලට ඔහු වැරදිකරු බවට පත්කරමින්, විධිමත් විනය පරීක්ෂණයේදී ගනු ලැබ ඇති තීරණයෙහි දෝෂයක් පෙනෙන්නට නැත.

මීළඟට සළකා බැලිය යුතු වන්නේ, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනාවන්ට ඔහු වැරදිකරු බවට පත් කිරීමෙන් පසුව, ඔහු වෙත නිකුත් කර ඇති විනය නියෝගයේ නිරවද්‍යතාවයයි.

අභියාචකට එරෙහිව නිකුත් කර ඇති විනය නියෝගය පහත දැක්වේ,

> ***"ආර්.පී.එම්.වීරසිංහ මහතා වෙත නිකුත් කර ඇති මගේ සමාංක හා 2020.06.29 දිනැති චෝදනා පත්‍රය සම්බන්ධයෙන් පැවති විධිමත් විනය පරීක්ෂණයේ පරීක්ෂණ නිලධාරීගේ, පැමිණිල්ල මෙහෙයවීමේ නිලධාරීගේ හා රැකවරණ නිලධාරීගේ වාර්තාවන් ද, අදාළ සියළු වාචික හා ලිඛිත සාක්ෂි ද සළකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ආර්.පී.එම්.වීරසිංහ මහතා එකී චෝදනා පත්‍රයේ සඳහන් අංක I, II, III, IV, VII, VIII හා IX යන චෝදනා වලට වැරදිකරු බවටත්, අංක V චෝදනාවට නිවැරදිකරු බවටත් තීරණය කර, එම නිලධාරියාගේ විශ්‍රාම වැටුපෙන් 50% ක් අඩු කිරීමට නිර්දේශ කර ඇති බව කාරුණිකව දන්වමි.***

එම විනය නියෝගය අනුව අභියාචකගේ විශ්‍රාම වැටුපෙන් **50%** ක ප්‍රමාණයක් අඩුකර, ඉතිරි මුදල පමණක් විශ්‍රාම වැටුප ලෙස ගෙවීමට තීරණය කර ඇත.

විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් වන තීරණ ගැනීම සඳහා නීතියෙන් බලය පැවරී ඇත්තේ, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙතය. මෙම තත්ත්වය විශ්‍රාම වැටුප් සංග්‍රහයේ **12:2** වගන්තියේ පැහැදිලිව සඳහන් වේ. කෙසේ වෙතත් විනය පරීක්ෂණයකින් අනතුරුව, යම් නිලධරයෙකුගේ විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණයක් ගනු ලැබූ අවස්ථාවකදී, එම තීරණය එකී කොමිෂන් සභාවේ නිර්ක්ෂණ හා නිර්දේශයක් ලෙස ඉදිරිපත් කරමින්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දැනුම් දීමට හැකියාව ඇත. ඒ බව ආයතන සංග්‍රහයේ II කොටසේ, XLVIII පර්ච්ඡේදයේ **36:7** වගන්තියේ සඳහන්ව ඇත. මෙම අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති විනය නියෝගය එකී වගන්තිය යටතේ කරන ලද නිර්දේශයක් බව පෙනී යයි.

ඉහත දක්වා ඇති විනය නියෝගය නිකුත් කිරීම සම්බන්ධයෙන් වන පසුබිම පැහැදිලි කිරීමෙන් අනතුරුව, අභියාචක වෙත පනවා ඇති විනය නියෝගය, ඒ ආකාරයෙන් පවත්වා ගෙන යා හැකිද යන කරුණට අවධානය යොමු කරන ලදි. කිසියම් පුද්ගලයෙකුට විරුද්ධව චෝදනා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, එම පුද්ගලයා එම චෝදනා වලට වරදකරු බවට පත් කිරීමෙන් පසුව, දඬුවම් පැමිණවීමක් හෝ විනය නියෝගයන් නිකුත් කිරීමේ දී, අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග මොනවාද යන්න, උපරිමාධිකරණ නඩු තීන්දු මගින් පැහැදිලිව පෙන්වා දී ඇත. ඒ අනුව දඬුවම් නියම කිරීමට බලය පවරා ඇති නිලධාරියෙකු සතු අභිමතය ක්‍රියාත්මක කිරීමේ දී, එම අයට වල්බූරු නිදහසක් නොලැබේ. එබැවින් දඬුවම් නියම කිරීමේ දී ගතයුතු ක්‍රියා මාර්ග කෙසේ විය යුතුද යන්න සම්බන්ධයෙන්, ප්‍රකාශයට පත්කර ඇති නඩු තීන්දු කෙරෙහි අවධානය යොමු කරන ලදි.

දඬුවම් නියම කිරීමේ දී සළකා බැලිය යුතු කරුණු මොනවාද යන්න පහත සඳහන් අභියාචනා අධිකරණය මගින් ප්‍රකාශිත නඩු තීන්දුවක සඳහන් වේ. එය, **අසාන් මොහොමඩ් රිස්වාන්** එරෙහිව **නීතිපති,** අභියාචනාධිකරණ නඩු අංක **CA (PHC) - APN 141/2003** දරණ නඩුවේ **2015.03.25** දිනැතිව ප්‍රකාශයට පත්කර ඇති නඩු තීන්දුවයි. එම නඩු තීන්දුවට අනුව දඬුවම් නියම කරන අවස්ථාවකදී, සළකා බැලිය යුතු කරුණු වලට පහත සඳහන් දෑ ඇතුළත් විය යුතු බවට සඳහන් වේ.

***Objectives of sentencing include the following:***

***(i) To punish offenders to an extent and in a manner, which is just in all the circumstances;***

*(ii) To protect the community from offender;*

*(iii) To deter offenders or other persons from committing offences of the same or similar nature;*

*(iv)To establish conditions so that rehabilitation of offenders may be promoted or facilitated;*

*(v) To signify that the court and the community denounce the commission of such offences;*

*(vi) To maintain the required standards of societal expectations in making decisions;*

*(vii) To prevent overcrowding prisons also could be considered as one such objective particularly when it comes to developing countries such as ours.*

දඬුවමක් නියම කිරීමට අදාළව ඇති නීතිමය ප්‍රතිපාදන කෙරෙහි ද එම තීන්දුව ප්‍රකාශයට පත් කිරීමේ දී අවධානයට ලක් වී ඇත. ඒ සම්බන්ධයෙන් එහි මෙසේ සඳහන් වේ.

***At the same time, there are other statutory provisions that are applicable when sentencing a convicted person. One such provision is Section 303 of the Code of Criminal Procedure Act. Indeed, the Legislature, by enacting the Code of Criminal Procedure (Amendment) Act, No. 47 of 1999 has introduced the manner in which the sentence is to be determined and the way the sentence is to be suspended. In that Section 303, the matters that are to be considered before passing the sentence are stipulated. Those matters are as follows:***

***303. (1)***

- ***(a)*** ***The maximum penalty prescribed for the offence in respect of which the sentence is imposed***
- ***(b)*** ***The nature and gravity of the offence***
- ***(c)*** ***The offender's culpability and degree of responsibility for the offence***
- ***(d)*** ***The offender's previous character***
- ***(e)*** ***Any injury, loss or damage resulting directly from the commission of the offence***
- ***(f)*** ***The presence of any aggravating or mitigating factor concerning the offender***

*(g)* *The need to punish the offender to an extent in a manner, which is just in all circumstances*

*(h)* *The need to deter the offender or other persons from committing offences of the same or of a similar character*

*(i)* *The need to manifest the denunciation by the court of the type of conduct in which the offender was engaged in*

*(j)* *The need to protect the victim or the community from the offender*

*(k)* *The fact that the person accused of the offence pleaded guilty to the offence and such person is sincerely and truly repentant; or*

*(I)* *A combination of two or more of the above*

**ඉහත සඳහන් විශ්ලේෂණාත්මක ස්වභාවයේ වූ කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, අභියාචක වෙත නිකුත් කර ඇති විනය නියෝගය, එම කරුණු වලට අනුකූලව නිකුත් කර තිබේද යන කරුණට අවධානය යොමු කරන ලදි.**

**අභියාචක වෙත නිකුත් කර ඇති ඉහතින් සඳහන්ව ඇති විනය නියෝගයට අනුව, අභියාචකගේ විශ්‍රාම වැටුප 50%ක ප්‍රමාණයකින් අඩුකර, ගෙවන ලෙසට නිර්දේශ කර ඇත. බැලූ බැල්මට එය බරපතල ස්වභාවයේ වූ දඬුවමකි. යම් පුද්ගලයෙකු විශ්‍රාම යෑමෙන් අනතුරුව ඔහුගේ මරණය දක්වාම විශ්‍රාම මුදල් ලබා ගැනීමට අයිතිවාසිකම ඇත. එසේ නම් යෝජිත දඬුවම අභියාචකගේ මුලු ජීවිත කාලය පුරාවටම ඔහුට ලැබෙන ආදායම සම්බන්ධයෙන් එය බලපානවා ඇත. එවැනි බරපතල තත්ත්වයේ වූ දඬුවමක්, අභියාචක වරදකරු බවට පත්කර ඇති චෝදනා සම්බන්ධයෙන් සළකා බැලීමේ දී සුදුසු හා යෝග්‍ය අන්දමේ දඬුවමක් දැයි සළකා බැලිය යුතුය.**

**රජයට අයත් වන සම්පතට හානි කිරීමට කිසියම් හෝ ආකාරයකින් හෝ ව්‍යංගයෙන් හෝ අභියාචකගේ ක්‍රියා හේතු වී තිබුණේ නම්, එය බලවත් වරදකි. දඬුවම් නියම කිරීමේ දී ඒ ගැන විශේෂ අවධානය යොමු කළ යුතුය. තවද, කිසියම් රජයේ නිලධාරියෙකුට පැවරී ඇති රාජකාරීමය වගකීම් නොපිරිහෙලා ඉටු කිරීම එම තැනැත්තාගේ වගකීම හා යුතුකම වනවා ඇත. මෙහිදී අභියාචක විසින් එම වගකීම ඉටුකර නැත. එබැවින් එවැනි වරදකට, වරදකරු බවට පත්කර ඇති අභියාචකට දඬුවම් පැමිණවීමේ දී, එම කරුණු ද සළකා බැලීම වැදගත් වනවා ඇත.**

කෙසේ වෙතත්, අභියාචක ඉතාමත් දීර්ඝ කාලයක් රජය වෙනුවෙන් සේවය කර ඇති පුද්ගලයෙකි. ඔහු වෙනත් වැරදි වලට වැරදිකරු වී ඇති බවකට කරුණු ඉදිරිපත් නොවේ. අභියාචකගේ තනතුර අනුව ඔහු වගකීම් සහිත රාජකාරියක යෙදෙමින්, ඒවා ඉටු කිරීමට කටයුතු කර ඇත. දඩුවම් පැමිණවීම, අභියාචක විශ්‍රාම යෑමට ආසන්නයේ දී සිදුකර ඇත. ඔහු මින් ඉදිරියට රජයේ සේවයේ නියැලෙන්නේ ද නැත.

මේ අවස්ථාවේ දී, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්, මෙම විනිශ්චය අධිකාරය වෙත එවන ලද **2025.11.27** දිනැති වාර්තාව කෙරෙහිද අවධානය යොමු කරන ලදි. එම වාර්තාවේ **3**(VI) ඡේදයේ සඳහන් කර ඇත්තේ, **2021.08.17** දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, හෙක්ටයාර් **202.33** (අක්කර **500**) පමණ වන මෙම රක්ෂිත ඉඩම නෙල්නා ඇග්‍රි ඩිවලොප්මන්ට් ආයතනය වෙත වානිජ කටයුත්තක් සඳහා දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දීමට තීරණය කර ඇති බවයි. එයින් පැහැදිලි වන්නේ අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා පදනම් කරගෙන තිබූ නෙල්නා සමාගමේ අනවසර භුක්තිය ඒ ආකාරයෙන්ම පැවතුනත්, පසු කාලීනව ඉදිරිපත්ව තිබූ විවිධ හේතූන් සළකා බලා, රජය විසින්ම එකී නෙල්නා සමාගමට ලබාදීමට කටයුතු කර ඇති බවයි.

ඉහත කරුණු සළකා බැලීමේ දී පැහැදිලිව පෙනී යන්නේ, අභියාචකට එරෙහිව, **2023.10.17** දින නිකුත් කර ඇති විනය නියෝගය නියම කරන අවස්ථාව වන විටත්, ඉහතින් සඳහන් කර ලද **2021.08.17** දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය නිකුත් කර ඇති බවයි. එබැවින් මෙම කරුණ විනය නියෝගය නිකුත් කරන විටදී සළකා බැලිය යුතුව තිබුණි.

ඉහතින් සඳහන් කරන ලද කරුණු අනුව පෙනී යන්නේ,

- අදාළ වරදේ ස්වභාවය හා බරපතලකම, විනය නියෝගය නිකුත් කරන අවස්ථාව වන විට පහළ මට්ටමකට එළඹ තිබී ඇති බවත්;
- ඉදිරිපත් කර තිබූ වරද සම්බන්ධයෙන් වන වගකීම, ඉහළ නිලධාරීන්ගේ වගකීම හා සංසන්දනාත්මකව බලන විට අභියාචක සම්බන්ධයෙන් අඩු මට්ටමකින් පැවතීමත්;
- අභියාචකගේ පෙර චර්යා සටහන් වල දෝෂයක් නොමැති වීමත්;

යන කරුණු සළකා බැලිය යුතුව තිබුණ බවත්, එම කරුණු සළකා බැලීමේ දී, අභියාචක වෙත පනවා ඇති දඩුවම අධික සහ බරපතල තත්ත්වයෙන් යුත් දඩුවමක් බව පෙනී යයි. එබැවින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභියාචකගේ විශ්‍රාම වැටුපෙන් **50%**ක් අඩු කරමින් කර ඇති තීරණය වෙනස් කර, එම ප්‍රතිශතය **20%** විය යුතු බවට තීරණය කරමින් නියෝග කරමු.

ඉහත නියෝගය අනුව ඉදිරි පියවර ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නියම කර නියෝග කරමු. ඒ බව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දෙන ලෙසද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත තවදුරටත් නියම කරමු.

ඉහත නියෝගය ක්‍රියාත්මක කර, මෙම විනිශ්චය අධිකාරය වෙත දැනුම් දීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නියම කර, නියෝග කරමු.

ඉහත සඳහන් හේතුන් සළකා බලා, එහි සඳහන් කොන්දේසි වලට යටත්ව ඉදිරිපත් කර ඇති අභියාචනට ඉඩ ලබාදීමට තීරණය කරමු.

ඉහත සඳහන් කොන්දේසි වලට යටත්ව අභියාචනයට ඉඩ ලබාදෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-